**සොරණාතොට ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 ජූලි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය වෙනුවෙන්, සමාලෝචිත වර්ෂය තුලදී ගෙවිය යුතු රු.708,706 ක පොළිය ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම රු.708,706 ක් අඩුවෙන්ද, 2012 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු රු.1,765,699 ක් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන නොසැලසීම නිසා බැරකම් රු.1,765,699 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ මහජන උපයෝගීතාවයන් සඳහා සභාව වෙත ලබාදෙන ලද ගැල්වනයිස් කොඩි කණු 392 ක වටිනාකම වූ රු.387,500 ක් ප්‍රාග්ධනිත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.387,500 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සභාවට ලබාදෙන ලද බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම වූ රු.265,000 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.265,000 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 03 කදී කර්මාන්ත සඳහා ගෙවන ලද රු.669,515 ක් වූ අත්තිකාරම් මුදල් වර්ෂයේ වියදමට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් රු.669,515 ක් අඩුවෙන් ද වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ජෛකා ආයතනය මඟින් කසල ව්‍යාපෘතියක් ලබාදීම වෙනුවෙන් ගෙවිය යුතු මුදලක් ලෙස රු.450,641 ක් ණයහිමියන් යටතේ ප්‍රතිපාදනය කර තිබුණද එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් වර්ෂයේ වියදම් හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන් රු.450,641 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 17,620,630 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.25,288,272 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 648,255,255 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | 2014 වර්ෂය සඳහා සභාවෙන් වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණු ව්‍යාපාර 16 ක් අදාල ගැසට් නිවේදනයේ (ඇ) උපලේඛණය යටතට ගැනෙන ව්‍යාපාරද යන්න සමීක්ෂණයක් මඟින් හඳුනාගෙන පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි
----------------------------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 396(ඈ) | නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු.47,575 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | අවස්ථා 24 කදී සභාවේ මුදල් තැන්පත් කර, වසර 02 ක් ඉක්මවූ රු.42,384 ක් වටිනා තැන්පත් නියාදනය කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 751 හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 212 | සභාව වෙත ලැබී තිබුණු වටිනාකම රු.132,500 ක් වූ බහුකාර්ය ජංගම කුටි 5 ක් හා වටිනාකම රු.387,500 ක් වූ කොඩිකණු 392 ක් තොග ලේඛණවලට හෝ ඉන්වෙන්ට්‍රි ලේඛණවලට ඇතුලත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබාගිය සේවකයින් 06 දෙනෙකුගෙන් වසර 05 ක කාලයක සිට අය නොවී පවතින රු.25,530 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.959,241 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.11,637 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.947,604 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.760,874 ක් හා මුද්දර ගාස්තු රු.1,532,352 ක් ලැබිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

2013 වර්ෂයේ උපමාන පාදක සංවර්ධන යෝජනා යටතේ, ඉඩමේගම ඉහල දෙහිගස්තැන්න පඩිපෙල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ලබාදී තිබුණු රු.50,000 ක මුදලින් අදාල ව්‍යාපෘතිය ඉටුකිරිමට පියවර ගෙන නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය